## හැඳින්වීම

පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයට අවශ්‍ය මිනිස් බල සම්පත් සපුරා ලීමේ අරමුණින් දශක හතරකට වැඩි කාලයක් තිස්සේ, විවිධාකාරයේ පාඨමාලා රාශියක් පවත්වා ගෙන යනු ලබන එක ම ජාතික විශ්වවිද්‍යාලය, බවට පත්ව ඇත්තේ කැලණිය විශ්වවිද්‍යාලයයි. කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය මගින් මේ වන විට සාමාන්‍ය ශාස්ත්‍රවේදී හා විශේෂ ශාස්ත්‍රවේදී (අභ්‍යන්තර) පාඨමාලා ද, සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) පාඨමාලා ද, ඩිප්ලෝමා, ශාස්ත්‍රපති හා සමාජීය විද්‍යාපති පාඨමාලාව ද පවත්වාගෙන යනු ලැබේ. මීට අමතරව පුස්තකාල හා විඥාපන විද්‍යා පිළිබඳ දර්ශනපති (M.Phil) සහ දර්ශන විශාරද (Ph.D.) උපාධි පාඨමාලා සඳහා ද ලියාපදිංචි විය හැකිය.

## පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා

### අරමුණ

මේ පාඨමාලාවේ ප්‍රධාන අරමුණ වන්නේ පුස්තකාල හා විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ කටයුතු හා ක්‍රියාවලිය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික අවබෝධයකින් පිරිපුන් වෘත්තිකයන් බිහි කරලීම ය.

### කාලසීමාව

පාඨමාලාවේ එක් කොටසක් සම්පූර්ණ කිරීම සඳහා වසරක් ගතවේ. වර්ෂාවසානයේ පැවැත්වෙන පරීක්ෂණයෙන් පසුව ඒ ඒ කොටස සඳහා සහතික නිකුත් කෙරේ.

### දේශන/නිබන්ධන

විශ්වවිද්‍යාලය මගින් අනුමත දේශක මණ්ඩලයක් විසින් කැලණිය විශ්වවිද්‍යාලීය දේශන ශාලාවන්හි දී ඉරිදා දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා දේශන හා නිබන්ධන පන්ති පවත්වනු ලැබේ.

### ඇතුළත්වීමේ සුදුසුකම්

1. **පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - ප්‍රථම කොටස**
   අ.පො.ස. (උ.පෙ) විෂයයන් 03 කින් එකවර සාමාර්ථ්‍යය හෝ අ.පො.ස. (සා.පෙ) සාමාර්ථ්‍යය සමඟ පිළිගත් පුස්තකාලයක වසර තුනකට නොඅඩු පළපුරුද්දක් තිබිය යුතුය. සහ අ.පො.ස. (සා.පෙ) ඉංග්‍රීසි විෂයයෙන් සාමාර්ථ්‍යය (ඉංග්‍රීසි විෂය අසමත් අය අධ්‍යයනාංශය මගින් පවත්වනු ලබන ඉංග්‍රීසි පරීක්ෂණය සමත් විය යුතුය)
2. **පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව - දෙවන කොටස**
   පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා ප්‍රථම පරීක්ෂණය (කැලණිය විශ්වවිද්‍යාලය) සමත්වීම හෝ ඊට සමාන සුදුසුකම්.
3. **පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමා පාඨමාලාව**
   පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා දෙවන පරීක්ෂණය (කැලණිය විශ්වවිද්‍යාලය) සමත්වීම හෝ ඊට සමාන සුදුසුකම්.

   හෝ

   පුස්තකාල විද්‍යාව විෂයක් වශයෙන් හදාරා, සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධිය සමත්වීම හෝ ඊට සමාන සුදුසුකම්.

### විෂය මාලා

**පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා - ප්‍රථම කොටස**

- පුස්වි 101 - පුස්තකාලයාධිකාරිත්වය හා විඥාපන තාක්ෂණය
- පුස්වි 102 - සම්බාර සංවිධානය හා තාක්ෂණික සේවා
- පුස්වි 103 - විඥාපන මූලාශ්‍ර හා උපයෝජක සේවා
- පුස්වි 104 - දැනුම සංවිධානය

**පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා - දෙවන කොටස**

- පුස්වි 201 - පුස්තකාල සංවිධානය
- පුස්වි 202 - දැනුම සංවිධානය
- පුස්වි 203 - පුස්තකාල හා විඥාපන මධ්‍යස්ථාන කළමනාකරණය
- පුස්වි 204 - තොරතුරු සංවිධානය හා ප්‍රලේඛන සේවා

**පුස්තකාල හා විඥාපන විද්‍යා උසස් ඩිප්ලෝමා**

- පුස්වි 301 - දැනුම සංවිධානය
- පුස්වි 302 - පර්යේෂණ ක්‍රම
- පුස්වි 303 - තොරතුරු විද්‍යාව: පද්ධති, සැලසුම් හා ජාලගත කිරීම.
- පුස්වි 304 - පුස්තකාල ස්වයංක්‍රීයකරණය

**ඉගැන්වීමේ මාධ්‍යය** : සිංහල/ඉංග්‍රීසි

**සම්පූර්ණ පාඨමාලා ගාස්තු**
**(ලියාපදිංචි ගාස්තු හා විභාග ගාස්තු ඇතුළත්ව)**

ඩිප්ලෝමා ප්‍රථම කොටස - රු. 17750.00
ඩිප්ලෝමා දෙවන කොටස - රු. 19750.00
උසස් ඩිප්ලෝමා පාඨමාලාව - රු. 21750.00

පාඨමාලා ගාස්තු එකවර ගෙවීමට අපහසුනම් වාරික තුනකින් ගෙවිය හැකිය. ප්‍රථම කොටස සඳහා ලියාපදිංචි වන සිසුන් පළමු වාරිකය සඳහා රු.7750.00 ක් ද දෙවන කොටස සිසුන් රු.9750.00 ක් ද උසස් ඩිප්ලෝමා සිසුන් රු.11750.00 ක් ලෙස ගෙවිය හැකිය. දෙවන හා තෙවන වාරික රු. 5000.00 බැගින් ගෙවිය හැකිය.
(දෙවන වාරිකය 2015.05.01 ට පෙරත් තෙවන වාරිකය 2015.07.01ට පෙරත් ගෙවිය යුතුය.)

**දේශන පවත්වන වේලාව**

ඉරිදා පෙ.ව. 9.00 - ප.ව. 3.00

**අයදුම්පත් නිකුත් කිරීමේ අවසන් දිනය**

2015.02.28

**විමසීම්**

මේ පාඨමාලා පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය නම් පහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය.

පාඨමාලා සම්බන්ධීකාරක
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

**දූරකථනය**

011-2917712
011-2903901

පාඨමාලාව පිළිබඳ වැඩි විස්තර http://www.kln.ac.lk දරන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

# පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලා - 2015

ශික්ෂා නිර්දේශ

පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය
සමාජීය විද්‍යා පීඨය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය